# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2325/84 - 2023 අප්‍රේල් මස 01 වැනි සෙනසුරාදා - **2023.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : HRP/LND/ACQSN/12/05.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/9/2014/අයිආර්/348සී.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :*

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හුරුළු පළාත මැද සුළු කොට්ඨාසයේ අංක 143 වාගොල්ලාකඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වාගොල්ලාකඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක 110432 හි කළාප අංක 02 පත්‍ර අංක 03 ඉඩම් විස්තර ලැයිස්තුවේ පිටු අංක 01 හි ඉඩම් කැබලි 1-3 දක්වා පිළියෙල කරන ලද 2023.02.23 දිනැති කැඩැස්තර සිතියමේ දක්වා ඇති හෙක්ටයාර් 4.5020 ක් වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අංක 01**
ඉඩමේ නම: හල්මිල්ලකටුව; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.4552.

**02. කැබලි අංක 02**
ඉඩමේ නම: හල්මිල්ලකටුව; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය, කරුණාරත්නගේ ස්වර්ණලතා විසින් අනවසරයෙන් භුක්ති විඳ ඇත; ප්‍රමාණය: හෙක්. 2.0234.

**03. කැබලි අංක 03**
ඉඩමේ නම: හල්මිල්ලකටුව; විස්තරය: විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය, කරුණාරත්න ගම් විතානගේ චාමර මුණසිංහ විසින් අනවසරයෙන් භුක්ති විඳ ඇත; ප්‍රමාණය: හෙක්. 2.0234.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් ඉදිරිපත් කිරීම පිණිස තමන් හෝ ඔවුන්ගේ ලිපිවලින් බලය පැවරුණු අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි ඒ ඒ ඉඩම් කැබලි අංක සඳහා පහත නියමකර ඇති වේලාවට හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

| දිනය | වේලාව | ඉඩම් කැබලි අංක |
|---|---|---|
| 2023.04.24 | පෙ.ව. 9.30 | 01 - 03 |

තව ද, 2023 අප්‍රේල් මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. කේ. ජී. මොරවක,
ප්‍රාදේශීය ලේකම්,
හොරොව්පොතාන.

2023 මාර්තු මස 27 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04 - 0016


1A - G 039269 – 09 (2023/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*